# ශ්‍රී ලංකා

## පොලිසිය සහ ආරක්ෂක අංශ විසින් දියත් කරන ප්‍රචණ්ඩත්වය මෙන්ම උද්සෝෂණ ප්‍රවේශමින් රූගත කිරීම සඳහා දස ඉඟි

WITNESS
SEE IT FILM IT CHANGE IT




### 1 මුරපද ආරක්ෂණය

ඇඟිලි සලකුණු හෝ මුහුණ හඳුනාගැනීමේ ආරක්ෂක ක්‍රම නොව ඔබේ ස්මාර්ට් ජංගම දුරකථනය මුරපදයක් යොදා ආරක්ෂා කරන්න. ඔබේ ස්මාර්ට් ජංගම දුරකථනය කිසිවකු විසින් සිය භාරයට ගැනීමේ අවධානමක් ඇතිනම් දුරකථනය සංකේතනය (encrypt) කරන්න, නැතිනම් එහි ඇති තොරතුරු මකා දමන්න.



### 2 බැටරි ආරෝපණය

ඔබේ බැටරි ආරෝපණය කර දුරකථනයේ දත්ත ගබඩාවේ ඉඩ සලසා ගන්න. ස්වයංක්‍රීය උපස්ථ (back-up) සක්‍රිය කරන්න. උදා:- Google Photos. දුරකථනය අස්ථානගත වුවහොත් / හානි වුවහොත් / රාජසන්තක කළහොත්, තොරතුරු ආරක්ෂා කර තබා ගැනීමට Dropbox භාවිතා කරන්න.



### 3 බලශක්ති ගබඩාවක් ගන්න

විදුලි බිඳවැටීම් සිදුවන අවස්ථාවලදී ඔබේ උපකරණ ආරෝපණය කිරීම සඳහා අතේ ගෙන යාහැකි බලාගාරයක් (power bank) හෝ කාර් බැටරි අපවර්තකයන් (inverters) ලබා ගැනීම පිළිබඳ සැලකිලිමත් වන්න.



### 4 GPS තාක්ෂණය බලගන්වන්න

ප්‍රවෘත්ති මාධ්‍ය, උසාවි සහ මානව හිමිකම් සංවිධානවලට ඔබේ වීඩියෝව සත්‍යාපනය කිරීමට සහ එය සත්‍ය බව ඔප්පු කිරීමට උදවු කිරීමට ස්මාර්ට් ජංගම දුරකථනයේ GPS (ඉහළ නිරවද්‍යතා) තාක්ෂණය සක්‍රිය කරන්න. ඔබ ආරක්ෂා සහිත නම්, රූගත කිරීම් කරන්නේ ඔබ බවට තහවුරු කිරීමට කැමරාවට / ජංගම දුරකථනයට කතා කරන්න. රූගත කරන ස්ථානය තහවුරු වන ලෙසට මාර්ගවල නාම පුවරු, මංසන්ධි හා සන්ධිස්ථාන රූගත කරන්න.





### 5 බොඳ කිරීමේ උපාංග

සජීවී රූගත කිරීමක් නොවේ නම්, පුද්ගලයින් ආරක්ෂා කිරීම සඳහා බොඳ කිරීමේ උපාංගයක් (blurring tool) යොදාගන්න. ඒ සඳහා ඔබට යොදාගත හැකි උපාංග කිහිපයක් පහත වේ.

- **YouTube (browser-based):** https://bit.ly/youtube-blurring
- **PutMask (Android):** https://bit.ly/putmask-app
- **Anonymous Camera (iOS):** https://apple.co/3iZZ3Xx



### 6 ප්‍රචණ්ඩත්වය ගැන වාර්තාගත කරන්න

පොලිසියේ හා ආරක්ෂක අංශවල වාහන, නිල ඇඳුම් සහ නිල ලාංඡන ආදිය රූගත කරන්න. ආරක්ෂා සහිත නම් වෙඩි තැබීම් හෝ ප්‍රචණ්ඩ ක්‍රියා රූගත කරන්න. එමෙන්ම එම සිදුවීම් වලට සම්බන්ධ වූවන්, වටේ සිටිනා ජනකාය, තුවාලකරුවන්, ගොඩනැගිලිවලට සිදුවී ඇති හානි, වෙඩි උණ්ඩ වැදුණු සිදුරු හෝ අවට ඇති වාහන ආදිය රූගත කරන්න.

### 7 වින්දිතයන් ගැන වාර්තාගත කරන්න

වින්දිතයන් සාමකාමීව හැසිරුණු අය බවට පෙන්වා දෙන්න. බලපෑමට ලක්වූවන්, විශේෂයෙන් ඔවුන් ඉලක්ක කර ප්‍රහාර එල්ල වී ඇත්නම්, රූගත කර පෙන්වන්න.




### 8 වීඩියෝ වලට ශීර්ෂ පාඨ යොදන්න

යම් සමාජ මාධ්‍යයකට වීඩියෝවක් මුදා හැරීමට ඔබ තීරණය කරන්නේ නම් (උදා:- ෆේස්බුක්/ට්විටර්/යූටියුබ්), ඔබ එසේ කරන්නේ මානව හිමිකම් උල්ලංඝණය කිරීමක් පිළිබඳ හෙළිදරව් කිරීමට බව කෙටි විස්තරාත්මක සටහනක් තබන්න. හැකිනම් වීඩියෝව ආරම්භයේදී යම් ශීර්ෂ පාඨයක් යොදන්න. මෙය ඉතා වැදගත් වන්නේ එසේ කළ විට වීඩියෝව යම් සිදුවීමක සාක්ෂියක් ලෙස එම මාධ්‍යයයේ දිගටම පවතින අතර ප්‍රචණ්ඩ දර්ශන ඇතුළත් වීම හේතුවෙන් ඉවත් කිරීමකට ලක්නොවනු ඇත.




### 9 වීපීඑන් සහ රෝමින් සිම්පත්

ඔබේ ඩේටා සහ අන්තර්ජාල සබඳතාව ගැන විමසිලිමත් වන්න. ඔබට හැකි නම් VPN සහ රෝමින් සිම් පතක් සූදානම් කර ගන්න. අන්තර්ජාලය වසා දැමීමේදී ලේඛනගත කිරීම පිළිබඳ සම්පත:

wit.to/internet-shutdowns




### 10 ලිපිගොනු ආරක්ෂා කරගන්න

ඔබේ වීඩියෝවේ මුල් පිටපත් ආරක්ෂිත ස්ථානයක තබාගන්න. මුල් පිටපත කිසිවිටක සංස්කරණය නොකරන්න. ඔබ සංස්කරණයන් කරන්නේ නම් වෙනත් පිටපත් යොදාගන්න.



ILLUSTRATIONS BY @GORES.GARIS (INSTAGRAM)

උපදෙස් මාලාව v1.0 නිර්මාණාත්මක පොදු බලපත්‍රයක් යටතේ ප්‍රකාශනය කරන ලදී

රූගත කිරීම් පිළිබඳ තවත් විස්තර ඔබට අවශ්‍ය නම් library.witness.org වෙතට පිවිසෙන්න.

ඔබට මෙම සම්පත ගැන ප්‍රශ්න හෝ ප්‍රතිචාර ඇත්නම් හෝ ඔබ භාවිතා කරන උපාංග හා ශිල්පීය ක්‍රමයන් පිළිබඳ අප සමග බෙදා ගැනීමට කැමති නම්, අපගේ ට්විටර් හෝ ෆේස්බුක් හැන්ඩලයට ලියන්න: @WITNESS_Asia or fb.com/witnessasia.